# රාජ්‍ය ප්‍රතිපත්ති යටතේ රණවිරු සුබසාධනය - කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාන්ගොල්ල රණවිරු ගම්මානය ආශ්‍රිත අධ්‍යයනයක්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***ඩබ්. ජී. ටී. වීරසේකර***[1]
***ප්‍රියන්ත මුදලිගේ***[2]

**සංක්ෂේපය**

ලෝකයේ රණවිරුවන් උදෙසා නොයෙක් සුභසාධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවේ. ඒ සඳහා මූලික පදනම සැපයෙන්නේ පළමු ලෝක යුද්ධයේ දී ආබාධිත ඉංග්‍රීසි සෙබලුන්ගේ සුබසාධනය උදෙසා පොපි මල් ව්‍යාපාරය ආරම්භ කිරීමත් සමගය. පොපි මල් විකිණීමෙන් පසු ලැබෙන ආදායමෙන් රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සුභසාධනය උදෙසා යොදා ගන්නා ලදී. ඒ අනුව වර්තමානයේ ලෝකයේ නොයෙක් රාජ්‍යයන් රණවිරුවන් උදෙසා සුභසාධන ව්‍යාපෘති ක්‍රියාවට නංවනු ලබයි. ශ්‍රී ලංකාව තුළද රණවිරුවන් උදෙසා නොයෙක් සුභසාධන ව්‍යාපෘති ක්‍රියාවට නංවනු ලබයි. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ රණවිරුවන්ගේ සුබසාධනය උදෙසා ක්‍රියාත්මකවන රණවිරු නිවාස ව්‍යාපෘතිය තුළ සාර්ථකභාවයක් පවතිනවාද යන්න සහ ඔවුන්ගේ සුබසාධනය නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වනවාද යන්න අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයනය සඳහා දත්ත හා තොරතුරු රැස් කිරීමේ දි ප්‍රාථමික හා ද්විතියික දත්ත යොදා ගත් අතර ප්‍රාථමික දත්ත රැස් කිරීම ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා මඟින් ද, ද්විතියික දත්ත රැස් කිරීම වාර්ෂික වාර්තා, පුවත්පත් ලිපි, අන්තර්ජාලය ආදිය භාවිත කරමින් සිදු කරන ලදි. මෙහි දී අධ්‍යයන ප්‍රදේශය වශයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුවේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාන්ගොල්ල වසමේ රණවිරු ගම්මානය අශ්‍රිතව මෙම අධ්‍යයනය සිදු කරනු ලබයි. පවුල් 50ක් අහඹු ලෙස නියදිය වශයෙන් තෝරාගනු ලබයි. අධ්‍යයනයේ දත්ත හා තොරතුරු විශ්ලේෂණය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත දෙවර්ගයම භාවිතා කරනු ලැබේ. ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යාන විධික්‍රමය තුළින් ප්‍රස්තාර, වගු, ප්‍රතිශත භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය කරන ලදී. ගුණාත්මක දත්ත විශ්ලේෂණය කරනු ලැබුවේ විස්තරාත්මක ක්‍රමවේදය අනුවය. මෙම අධ්‍යයනය තුළින් පැහැදිලි වන්නේ නියදිය වශයෙන් තෝරාගත් පිරිස තම නිවාසය සම්බන්ධයෙන් 71% ක් තෘප්තිමත්භාවයෙන් පසුවන අතර 29% ක් ඒ සම්බන්ධව අතෘප්තිමත්භාවයෙන් සිටින බවයි. 2005 පත් වූ රජය යටතේ ඔවුන් වෙනුවෙන් සිදු කරන සුබසාධනය සම්බන්ධයෙන් ඔවුන්ගේ තෘප්තිමත්භාවය 78% ක් වන අතර ඒ සම්බන්ධයෙන් අතෘප්තිමත් පිරිස 22% ක් වේ. නමුත් ඔවුන්ගේ සුබසාධනය සම්බන්ධව යම් යම් ගැටලු ද පවතී.

ප්‍රමුඛ පද - සුබසාධනය, රණවිරුවන්, ව්‍යාපෘති

*1. දේශපාලන විද්‍යාව, ආර්ථිකවිද්‍යාව, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ආධුනික කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*